# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# සංඥා භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු - 2026
# (කොන්ත්‍රාත් පදනම)

---

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සංඥා භාෂා පරිවර්තක තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සහ විශිෂ්ට චරිතයකින් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ 2026 අප්‍රේල් 05 වන දින හෝ එයට පෙර "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සටහන: ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

***1.*** **තනතුරු ගණන : 03 (තුනයි)**

***2.*** **පත්වීමේ ස්වභාවය**

මෙම පත්වීම වසරක (01) කාලයක් සඳහා වන කොන්ත්‍රාත් පදනම මත ලබා දෙන පත්වීමක් වන අතර එය ස්ථිර හෝ විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් නොවේ.

***3.*** **රැකියාවේ ස්වභාවය**

ශ්‍රවණාබාධිත සහ අර්ධ වශයෙන් ශ්‍රවණාබාධිත පුද්ගලයන්ට පාර්ලිමේන්තුවේ කටයුතු සහ තොරතුරු වෙත ප්‍රවේශය පහසු කිරීම සඳහා අවශ්‍ය පරිදි පාර්ලිමේන්තු රැස්වීම්වල සහ කාරක සභා රැස්වීම්වල කටයුතු එසැනින්ම සංඥා භාෂාවට පරිවර්තනය කිරීම ඇතුළුව, සේවා අවශ්‍යතාවය මත පවරනු ලබන අදාළ අනෙකුත් රාජකාරි ඉටු කිරීම.

***4.*** වැටුප

රු. 68,955.00/- ක ස්ථාවර මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

***5.*** **වයස් සීමාව**

අවුරුදු 25 ට වැඩි - අවුරුදු 65 ට අඩු

***6.*** **අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද**

*අධ්‍යාපන සුදුසුකම්:*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයයන් දෙකක් ඇතුළුව විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙ) විභාගය සමත් වීම.

**සහ**

සියලුම විෂයයන් සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).(පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ).

*වෘත්තීය සුදුසුකම්:*

ජාතික අධ්‍යාපන ආයතනය (NIE) විසින් පවත්වනු ලබන සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා සහතිකය.

හෝ

ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) විසින් පවත්වනු ලබන සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා සහතිකය

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති ආයතනයක් විසින් පවත්වනු ලබන සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ එක් වසරකට නොඅඩු කාලයක ඩිප්ලෝමා සහතිකය.

*සේවා පළපුරුද්ද:*

සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

*වෙනත් නිපුණතා*

- විශිෂ්ට සන්නිවේදන සහ අන්තර්-පුද්ගල කුසලතා.
- නිල කටයුතුවලදී රහස්‍යභාවය සහ වෘත්තීයමයභාවය ආරක්ෂා කර ගැනීමේ හැකියාව.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

ප්‍රසිද්ධ දැන්වීමක් හරහා අයදුම්පත් කැඳවීම මගින් බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, වෘත්තීය පරීක්ෂණයක දී සහ ඉන් පසුව පත් කිරීමේ බලධාරියා විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක දී දක්වන කුසලතාවය මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(අ) වෘත්තීය පරීක්ෂණය

සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ ඔවුන්ගේ ප්‍රායෝගික නිපුණත්වය ඇගයීම සඳහා වෘත්තීය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

| විෂයය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සංඥා භාෂාව පිළිබඳ ප්‍රායෝගික දැනුම සහ සංඥා භාෂා පරිවර්තනය | පැය 1 | 100 | 40 |

(ආ) සම්මුඛ පරීක්ෂණය

වෘත්තීය පරීක්ෂණය සාර්ථකව සම්පූර්ණ කරන අපේක්ෂකයන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. එම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ඇගයීම සිදු කරනු ලබන අතර, ඒ සඳහා උපරිම ලකුණු 100 ක් ලබා ගත හැකි ය.

| අනු අංක | ඇගයීමේ නිර්ණායක |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | අදාළ පළපුරුද්ද |
| 4 | පෞරුෂය සහ සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්නුම් කරන කුසලතාවය |

**8. සේවා කොන්දේසි සහ නියමයන්**

(i) මෙම පත්වීම එක් වසරක (01) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමක් මත ලබා දෙන පත්වීමක් වන අතර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් නොවේ. තෝරාගනු ලබන අපේක්ෂකයාට පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයන්ට අදාළ වන විශ්‍රාම වැටුප් හෝ වෙනත් ප්‍රතිලාභ හිමි නොවේ.

(ii) සිදු කරනු ලබන පත්වීම් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. පුරප්පාඩු යම් සංඛ්‍යාවක් හෝ සියල්ලම හෝ පුරවා නොගැනීමට තීරණය කිරීමට ද පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට බලය තිබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයන් පාර්ලිමේන්තු මහලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසි වලට යටත් වේ.

(iv) තෝරාගනු ලබන අපේක්ෂකයන්, වයස අවුරුදු 60 ට අඩු නම් ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් නියම කර ඇති ප්‍රතිශතයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක කළ යුතුය.

(v) තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පත්වීම් ලබා දීමට පෙර ඔහු/ඇය සම්බන්ධයෙන් ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගනු ලැබේ.

**9. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

i. උප්පැන්න සහතිකය;
ii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
iii. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
iv. පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

**10. තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.**

**11. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර හෝ කරුණක් සාවද්‍ය යැයි යමෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.**

**12. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.(ආදර්ශ අයදුම්පත පාර්ලිමේන්තු වෙබ් අඩවියෙන් බාගත කිරීම සිදු කළ හැකිය).**

**කුෂානි රෝහණදීර**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2026 මාර්තු වැනි දින